# රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
## ජනමාධ්‍ය පර්යේෂණ අංශය

ලිපිනය : 163, කිරුළපන මාවත, කොළඹ 05 | දුරකථන : +94 112 512 749 | විද්‍යුත් තැපැල් : govinformediaresearch@gmail.com


ප්‍රධාන කර්තෘ/ ප්‍රවෘත්ති කර්තෘ
අධ්‍යක්ෂ(ප්‍රවෘත්ති)/ ප්‍රවෘත්ති කළමනාකරු

## ප්‍රවෘත්ති නිවේදනය

**සිනමාව සමාජ විද්‍යාත්මකව කියවීම......**

**පොලිස් හා ත්‍රිවිධ හමුදා නිලධාරීන් ගේ චිත්ත ධෛර්යය හා මානසික සංවර්ධනය වෙනුවෙන් විශ්ව සම්භාව්‍ය සිනමා දැක්මක්**

**"Vardhan Ketkar" අධ්‍යක්ෂණය කළ "Gumraah" චිත්‍රපටය**
**2024.07.19 දින පස්වරු 1.00 ට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ශ්‍රවණාගාරයේ දී...**

රාජ්‍ය ප්‍රතිපත්ති අනුව, දියුණු සංස්කෘතික මිනිසකු බිහි කිරීම සහ සිනමාව සමාජ විද්‍යාත්මකව කියවමින් පොලිස් හා ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගේ දැනුම, අධ්‍යාපනය සහ රසවින්දනය දියුණු කිරීමේ අරමුණින් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව පොලිස් මාධ්‍ය  කොට්ඨාසය,  ත්‍රිවිධ හමුදා මාධ්‍ය අංශ සමග ඒකාබද්ධව මසකට වරක් සංවිධානය කරනු ලබන විශ්ව සම්භාව්‍ය සිනමා දැක්ම සහ සිනමා කතිකා වැඩසටහන යටතේ 2024.07.19 දින පස්වරු 1.00 ට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ විශේෂ චිත්‍රපට ප්‍රදර්ශනය පැවැත්වේ.

මෙහිදී නීතිගරුක, යුක්තිගරුක පොලිස් සේවාවක් වෙනුවෙන් පොලිස් නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනයට බලපානු ලබන අපරාධ නීතිය, මානව හිමිකම්, සමාජ අපරාධ, සිවිල් නීති යටතේ දැනුමක් ලබාගත හැකි විශ්ව සම්භාවනාවට පත් චිත්‍රපට ප්‍රදර්ශනය කර පොලිස් නිලධාරීන්ට සිනමාව සමාජ විද්‍යාත්මකව කියවමින් යම් දැනුමක් ලබා දෙන අතර, ඒ සඳහා මෙවර ප්‍රදර්ශනය වනුයේ **"Vardhan Ketkar"** අධ්‍යක්ෂණය කළ **"Gumraah"** චිත්‍රපටය යි.

ඝාතනයට ලක්වන තරුණයකු හා ඉන් අනතුරුව සිදුවන පොලිස් පරීක්ෂණ  නිරූපණය කරන, **"Gumraah"** චිත්‍රපටය පිළිබඳ විචාර දේශනය රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ආචාර්ය  හර්ෂ .බී අබේකෝන්  මහතා විසින් පවත්වනු ලබන අතර, නියෝජ්‍ය පොලිස්පති නීතිඥ නිහාල් තල්දූව මහතා ඇතුළු පොලිස් නිලධාරීන් 300 කට ආසන්න පිරිසක් මෙම චිත්‍රපට ප්‍රදර්ශනය සඳහා එක්වන බව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ජනමාධ්‍ය පර්යේෂණ අංශය පවසයි.

*ජනමාධ්‍ය පර්යේෂණ අංශය,*
*රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.*
*2024/07/11*